**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම් දිස්ත්‍රික්කය**
**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 24 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 20 දින ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනයකළ මතය**
**--------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා ශේෂය රු.2,685 ක් අත්හැරී තිබූ අතර, විදුලි තොග ගබඩා ශේෂය රු.37,250 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් රු.309,252 කින් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**----------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.15,427,139 ක් හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.24,775,207 ක් විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**--------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.120,375,331 ක් වූ ගිණුම් ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**
**-------------------------------------------------**

නීති,රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී විධිමත් පරිදි අයකර ගැනීමට සහ 158 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ වරිපනම් බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය හා පරිපාලන) 5(7) රීතිය සහ 217 රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 02 ට වැඩි කාලයක් වූ රු.58,100 ක් වටිනා තැන්පත් 14 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,368,661 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,935,974 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

<u>වියදම් ව්‍යුහය</u>
සමාලෝචිත වර්ෂයේ සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම අදාල විචලනයන් ද සමඟ පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| **<u>පුනරාවර්තන වියදම</u>** | | | |
| පුද්ගලික පඩිනඩි | 22,434 | 17,707 | 4,727 |
| අනෙකුත් | 7,943 | 6,828 | 1,115 |
| උප එකතුව | 30,377 | 24,535 | 5,842 |
| **ප්‍රාග්ධන වියදම** | 101,589 | 9,236 | 92,353 |
| මුළු එකතුව | 131,966 | 33,771 | 98,195 |

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සභාවේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **2015** | | **2014** | |
|---|---|---|---|
| **<u>ජංගම වත්කම්</u>** | **<u>ජංගම වගකීම්</u>** | **<u>ජංගම වත්කම්</u>** | **<u>ජංගම වගකීම්</u>** |
| 1.52 | 1 | 1.36 | 1 |

ඒ අනුව, කාරක ප්‍රාග්ධනයේ යහපත් ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය.

**2.4 ආදායම් පරිපාලනය**

**---------------------**

**2.4.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය</u>**

සමාලෝචිත වර්ෂයේ සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ---------------- | ------------------ | ------ | ------------------- |
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් | 535 | 334 | 201 |
| කුලී | 607 | 537 | 70 |
| බලපත්‍ර ගාස්තු | 718 | 734 | (16) |
| සේවා සඳහා ගාස්තු | 1,032 | 900 | 132 |
| <u>ජල බදු</u> | | | |
| - කරුවලගස්වැව | 559 | 477 | 82 |
| - ඉපලෝගම | 1,436 | 1,481 | (45) |
| - තොග ජල ව්‍යාපෘතිය | 420 | 303 | 117 |

**2.4.2 වරිපනම් බදු**

**-------------**

පසුගිය වර්ෂයේ සියයට 29 ක් වූ වරිපනම් බදු හිඟය සමාලෝචිත වර්ෂයේ දී සියයට 38 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.4.3 කුලී**

**-----**

සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.72,300 ක කුලී අයවීමට තිබූ අතර, එයින් වර්ෂය තුළ අයකරගෙන තිබූ මුදල රු.34,700 ක් වූයෙන් වර්ෂය අවසානයට අයවිය යුතු මුළු හිඟය රු.69,500 ක් ව තිබුණි.

**2.4.4 ජල බදු**

**--------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව තොග ජල ව්‍යාපෘතිවල හිඟයන් පිළිවෙලින් රු.127,000 ක් හා රු.117,000 ක් වූ අතර, පසුගිය වර්ෂයේ බිල්කල මුදලින් සියයට 3 ක් හා සියයට 21 ක් වූ හිඟය මෙම වර්ෂයේ බිල්කල මුදලින් සියයට 23 ක් හා සියයට 29 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) <u>උසාවි දඩ</u>

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත උසාවි දඩ රු.4,000,000 ක් වුවද, 2015 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා රු.1,394,669 ක් අයකර ගෙන තිබුණි.

(ආ) <u>මුද්දර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත මුද්දර ගාස්තු ආදායම රු.3,000,000 ක් වුවද, 2014 මැයි සිට 2015 දෙසැම්බර් අවසානය දක්වා මුද්දර ගාස්තු ගණන් බලා ප්‍රධාන ලේකම් වෙතින් ගෙන්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ZA-5261 දරන ෆෝටෝන් වර්ගයේ බැකෝ ලෝඩරයේ සහ ZA-5338 දරන මෝටර් ග්‍රේඩරයෙන් ආදායම් උපයා ගත්තද, ඒවායෙහි ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

## 3.2 හඳුනාගත් අලාභ

සමාලෝචිත වර්ෂයේ රු.41,614 ක් වටිනා පුස්තකාල පොත් 229 ක් අස්ථානගතවී තිබුණද, අදාල පාඩුව ආවරණය කර ගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සභාවේ කාර්මික නිලධාරීට රු.500,000 ක් දක්වා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා බලතල පවරා තිබුණද, එම සීමාව ඉක්මවා ඇස්තමේන්තු සකස් කර තිබුණි.

(ආ) කර්මාන්ත තාක්ෂණ ඇගයීම් කමිටුව ක්ෂේත්‍රය පිළිබඳව අවබෝධයක් ඇති පරිබාහිර තැනැත්තෙකුගෙන්ද සමන්විත විය යුතු වුවත්, සභාවෙහි තාක්ෂණික ඇගයීම් කමිටුව සභාවෙහිම නිලධාරීන් තිදෙනෙකුගෙන් පමණක් සමන්විතව තිබුණි.

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

රු.1,338,227 ක් වැයකර ඉදිකිරීම් සිදුකර 2014 වර්ෂයේ නොවැම්බර් 06 දින සභාවට භාරදී තිබූ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ගොඩනැඟිල්ල ඵලදායි ලෙස යොදවා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

## 4.1 අයවැය පාලනය

2015 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දී ඉකුත් වර්ෂවල ඇස්තමේන්තුගත දත්තයන්, තථ්‍ය වියදම හා පෙර අත්දැකීම් සැළකිල්ලට නොගැනීමෙන් අධි/ඌන වෙන්කිරීම් සිදුව තිබීම නිසා අයවැය ලේඛනය වියදම් පාලන කාරකයක් ලෙස  උපයෝගී කරගත නොහැකිව තිබුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

2015 වර්ෂයේ එක් විගණන හා කළමනාකරණ කමිටු වාරයක් පමණක් පවත්වා තිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

----------------------------

(අ) <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>

2015 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර තිබුණ ද, එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ආ) <u>පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>

(i) හෙක්ටයාර් 46 කට ආසන්න ඉඩම් කැබලි 63 ක් දීර්ඝ කාලයක් තිස්සේ සභාව භුක්ති විඳිමින් තිබුණද ඒවා සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2013 – 2015 දක්වා වර්ෂවල සභාවට ලබාදී තිබූ වාහන 06 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

රු.16,914,920 ක් වටිනා ගොඩනැඟිලි 06 ක් සහ පිළිවෙලින් රු.145,000 ක් හා රු.10,000 ක් වටිනා කුට්ටිගල් සැකසුම් යන්ත්‍රය සහ සැකසුම් අච්චුව කාලයක් තිස්සේ කිසිදු ප්‍රයෝජනයක් නොගෙන තිබුණි.

4.5 **බේරුම් නොකළ බැරකම්**

----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,069,499 ක බේරුම් නොකල බැරකම් තිබූ අතර, එයින් රු.42,558 ක ගිණුම් ශේෂ වර්ෂ 03 ක කාලය ඉක්මවා තිබුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

සභා ලේකම් තනතුර වසර කිහිපයක් තිස්සේ සිට පුරප්පාඩුව පවතින අතර, ද්විතියික ශ්‍රේණියේ තනතුරු 07 ක් සහ ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 06 ක් ද පුරප්පාඩු වී තිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ගබඩා පාලනය